පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

ශ්‍රේණිය - 8

සතිය- 5

Prepared by- ධයනා පුෂ්පරාණී මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

ශාන්ති කර්ම හඳුනා ගැනීම

<u>දෙවොල් මඩු ශාන්ති කර්මය</u>

<u>පැවැත්වීමට හේතු</u>

| අතීතයේ පැවැත්වීමට හේතු | වර්තමානයේ පැවැත්වීමට හේතු |
|---|---|
| සේරමාන් රජුට වැළඳුන හිසරදය සුවපත් කිරීම | • ධන ධාන්‍ය ගව මහීෂාදී බව භෝග සමපත් වැඩි දියුණු කර ගැනීමට.<br>• වසංගත රෝග සුවපත් කර ගැනීම.<br>• ගමට ප්‍රදේශයට,රටට පැමිණි ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම.<br>• පර්යේෂණ,අධ්‍යන කටයුතු සඳහා.<br>• සංරක්ෂණය කර ගැනීම සඳහා. |

<u>පහත රට දෙවොල මඩු ශාන්ති කර්මය</u>

පුරා වෘත්ත කතාව

සේරමාන් නම් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝනෙකු මරා දමන ලෙසට අණ කරන ලද හෙයින් භේවායන් ඌ පසුපස එළවා යන අවස්ථාවේ ගෝනාගේ පය පැටලී අසල තිබූ පොකුණකට වැටී මරණයට පත් විය.තමා මේ විපතට පත් වීමට හේතු වූයේ රජතුමාගේ අණ කිරීම බව දැනගත් ගෝනා, රජු කෙරෙහි වෛරයෙන් මිය ගොස් මෙම පොකුණෙහි කුඩා මැඩියෙකු වී උපදී.

දිනක් රජු පොකුණට යන අවස්ථාවේ පොකුණේ පිපී තිබූ මලක් කඩා එහි සුවඳ ආඝ්‍රාණය කරන විට එහි සිටි කුඩා මැඩියා රජුගේ නාසයට ඇතුළු වීම හේතුවෙන් රජුට බලවත් හිසරදයක් ඇති විය. ඉන් රෝගී තත්වයට පත් රජුට නොයෙකුත් ප්‍රතිකාර කරන ලද නමුදු ඉන් සුවයක් නොලැබිණි.දිනක් රජුට ඉතා රූමත් කාන්තාවක් සිහිනයෙන් පෙණුනාය.ඒ බව පුරෝහිත බමුණාට සැල කර සිටීයේය. පුරෝහිත බමුණාගේ අදහස වූයේ සිහිනෙන් පෙනී සිටියේ පත්තිනි දේවිය බවත් ඇයගේ ශාපයක් රජුට ඇති බවත්ය.

බුදු දහම ස්ථාපිත රටකට ගොස් පත්තිනි දේවියට පිං පැමිණවිය යුතු බව දන්වා සිටිය හෙයින් ඊට සුදුසුම රට ලංකාව බව තීරණය කල රජු සීනි ගම පුදේශයෙන් දිවයිනට පැමිණ රුවන්වැල්ල ප්‍රදේශයේදී ප්‍රථම දෙවොල් මඩුව කරවීය.එතැන් පටන් රජුගේ හිසරදය දුරු වූ බැවින් ලක්දිව දෙවොල් මඩු ශාන්ති කර්මය ආරම්භ වූ බව කියවේ.

පැවරුම

**1.**දෙවොල් මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු දක්වන්න.

**2.**දෙවොල් මඩු ශාන්තිකර්මයේ ප්‍රරාවෘත කතාව කෙටියෙන් ලියන්න.